ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2012 මැයි මස 18 වැනි දින |

**නේපාලයේ, පොකාරා නගරයේ දී "සාර්ක් කලාපයේ ආහාර උද්ධමනය" පිළිබඳ සාර්ක් මූල්‍ය ජාලයේ (SAARC FINANCE) මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය සඳහා ගෙන ඇති පියවර පැසසුමට ලක්විය**

2012 මැයි මස 16 වන දින නේපාලයේ පොකාරා නගරයේ දී සාර්ක් මූල්‍ය ජාලයේ මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික සම්මන්ත්‍රණය පැවැත් වූ අතර, එහි තේමාව වූයේ "සාර්ක් කලාපයේ ආහාර උද්ධමනය" යන්නයි. සාර්ක් රටවල ආහාර උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමකින් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා එම රටවල ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහාය දැක්වීම පිණිස එම කලාපය අතර අදහස් හුවමාරු කර ගැනීම සහ අත්දැකීම් බෙදාගැනීමට අවශ්‍ය කතිකාවක් ඇති කිරීම මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ විය. ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන සාර්ක් රටවල් අටේ මහ බැංකු අධිපතිවරු, මුදල් අමාත්‍යාංශ ලේකම්වරු සහ අනෙකුත් නියෝජිතයෝ මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූහ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, අජිත් නිවාඩ් කබ්රාල් මහතා සහ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා ස්වර්ණා ගුණරත්න මහත්මිය මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූ අතර, මෙහිදී ශ්‍රී ලංකාවේ දැනටමත් දේශීය ආහාර සැපයුම සැලකිය යුතු ඉහළ නැංවීමකට මග පාදමින් කෘෂිකාර්මික කටයුතුවලට සහ ආහාර නිෂ්පාදනයට පහසුකම් සැලසීමට ගෙන ඇති මූලික පියවර කතිකයන් කිහිපදෙනෙකුගේම පැසසුමට ලක්විය.

මෙම සම්මන්ත්‍රණයේ දී ආසියානු සංවර්ධන බැංකුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය සුල්තාන් හෆීස් රහ්මාන් විසින් "දකුණු ආසියාවේ මෑතකාලීන ආහාර මිල උද්ධමනය" යන තේමාව යටතේ ප්‍රධාන දේශනය සිදුකරන ලදී. එහිදී දේශීය ආහාර සැපයුම වැඩිකිරීම, ආහාර උද්ධමනය අඩුකිරීම සහ දරිද්‍රතා මට්ටම ඉහළ යාමේ අවදානම අඩුකර ගැනීම සම්බන්ධයෙන් ඒ ඒ රටවල් ගෙන ඇති ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය ඇගයීමට ලක්කළේය. තවද, මේ සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන

බැංකුව විසින් සිදුකරන ලද සමීක්ෂණයකට අනුව, සාර්ක් කලාපය තුළ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ආහාර උද්ධමනය මගින් දරිද්‍රතා මට්ටමට වන බලපෑම අඩුම මට්ටමක පවතින රට බව පෙන්වා දෙන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ මෙම අධ්‍යයනයට අනුව දකුණු ආසියාවේ රටවල ආහාර මිල ගණන් සියයට 30 කින් ඉහළයාමට සාපේක්ෂව දරිද්‍රතා මට්ටම ඉහළ යාමේ අවදානම දළ වශයෙන් සියයට 6.2 ක ඉහළ සාමාන්‍ය ප්‍රතිශතයක්ව පවතී. එසේ වුවද, ශ්‍රී ලංකාව සඳහා එම අගය සියයට 0.7 ක් පමණක් බව පෙන්වා දෙන ලදී. රහ්මාන් මහතා සිය දේශනයේ දී වර්තමානයේ සැලකිය යුතු සහ ශීඝ්‍ර ලෙස ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලෝක වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන් හේතුවෙන් ඇතිවන ඕනෑම අසමතුලිතතාවයකට මුහුණ දීම සඳහා සියලුම රටවල් විචක්ෂණශීලී ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බව යෝජනා කළේය.